# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2247/12 - 2021 සැප්තැම්බර් මස 29 වැනි බදාදා - 2021.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "2021 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2021 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

3. සංශෝධිත විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළ කරන ලද 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයට 2020 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද 2020 ඔක්තෝබර් මස 29 දිනැති අංක 2199/20 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ඇතුළත් කරන ලද, පහත දැක්වෙන උපලේඛනයේ I සහ II තීරු සහ ඊට අනුරූපී III සහ IV තීරු වල විස්තරකර ඇති, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ සහ සංයෝජිත වර්ගීකරණ කේත යටතේ නිශ්චිතව දක්වන ලද භාණ්ඩ එකී උපලේඛනයෙන් මෙමගින් ඉවත් කෙරේ.


1A - PG 5551 — 470 (2021/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍ර (L)* |
|---|---|---|---|---|---|
| **234** | **17.01** | | | **ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස්.** | |
| | | 1701.99.00 | -- | අනෙකුත් : | |
| | | 1701.99.10 | --- | සුදු ස්ඵටිකකෘත උක් සීනි | L |
| | | 1701.99.20 | --- | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | L |
| | | | | | |

10 - 112

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.